2015 ජූනි 18 දිනැති මෙහි ඉංග්‍රීසි පිටපත මත මෙම පරිවර්තිත ව.ද.ප පාදක වේ.

# ව්‍යාපෘති දත්ත පත්‍රය

ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධ සාරාංශගත කරන ලද තොරතුරු ව්‍යාපෘති දත්ත පත්‍රවල අඩංගු වේ. ව්‍යාපෘති දත්ත පත්‍රිකාවක් යනු වැඩ කෙරෙමින් පවතින ව්‍යාපෘති සම්බන්ධ වාර්තාවක් බැවින් ඇතැම් තොරතුරු මෙහි පළමු පිටපත් වල ඇතුළත් නොවිය හැකි අතර එකී තොරතුරු ලැබෙන පරිදි ඇතුලත් කරනු ඇත. යෝජිත ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු තාවකාලික සහ හඟවන තොරතුරු වේ.

| | |
|---|---|
| **ව්‍යාපෘති දත්ත පත්‍රය සැකසූ දිනය** | – |
| **ව්‍යාපෘති දත්ත පත්‍රය යාවත්කාලීන කරන ලද්දේ** | 2015 අප්‍රේල් 27 |

| | |
|---|---|
| **ව්‍යාපෘති නාමය** | හරිත බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතාවය දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන- ණය වාරික 1 |
| **රට** | ශ්‍රී ලංකාව |
| **ව්‍යාපෘති/ වැඩසටහන් අංකය** | 47037-004 |
| **තත්වය** | අනුමැතිය ලැබී ඇත |
| **භූගෝලීය පිහිටීම** | – |

රාජ්‍ය වැඩසටහනක් හෝ ක්‍රමෝපාය සැකසීමේදී, ව්‍යාපෘතිය මූල්‍යනය කිරීමේදී හෝ මෙම වාර්තාවේ යම් භූගෝලීය සීමාවක් සටහන් කිරීමේදී ඕනෑම ප්‍රදේශයක් හෝ භූමි සීමාවක් සම්බන්ධ නෛතික හෝ වෙනයම් තත්වයන් සම්බන්ධයෙන් ආසියානු සංවර්ධන බැංකුව විසින් කිසිදු මත දැක්වීමක් සිදුකිරීමට අපේක්ෂා නොකරයි.

| | |
|---|---|
| **ක්ෂේත්‍රය සහ/ හෝ උපක්ෂේත්‍ර වර්ගීකරණය** | බලශක්තිය |
| **අනුක්ෂේත්‍රය** | විදුලිබලය සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම<br>බලශක්ති කාර්යක්ෂමතාවය සහ සංරක්ෂණය<br>විශාල වශයෙන් ජලවිදුලිබලය උත්පාදනය |
| **ක්‍රමෝපාය න්‍යාය පත්‍රය** | පාරිසරික වශයෙන් ධරණීය වර්ධනය (ESG)<br>සමස්ත ආර්ථික වර්ධනය (IEG) |
| **වෙනස්වීමේ තීරක** | පරිපාලන සහ ධාරිතා සංවර්ධනය (GCD)<br>දැනුම් මූල විසඳුම් (KNS)<br>හවුල්කාරිත්වය (PAR) |
| **ස්ත්‍රී/පුරුෂ සමානතාවය සහ මුඛ්‍යධාරා වර්ගීකරණයන්** | වර්ගීකරණය 4: ස්ත්‍රී/පුරුෂ අංග අඩංගු නොවේ (NGE) |

## මූල්‍යකරණය

| සභායේ වර්ගය/ ප්‍රකාරතාව | අනුමත අංකය | අරමුදල් මූලාශ්‍රය | අනුමත වටිනාකම (දහස්) |
|---|---|---|---|
| ණය | 3146 | ආසියානු සංවර්ධන අරමුදල | 29,000 |
| ණය | 3147 | සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් | 121,000 |
| ණය | – | සංවර්ධනය සඳහාවූ ප්‍රංශ ආයතනය | 30,000 |
| – | – | ප්‍රතිරූප අරමුදල් | 40,000 |
| **මුළු එකතුව** | | | ඇ.එ.ජ.ඩො **220,000** |

## ආරක්ෂණ වර්ගීකරණයන්

ආරක්ෂණ වර්ගීකරණ පිළිබඳව වැඩි විස්තර සඳහා කරුණාකර පහත යොමුවට පිවිසෙන්න
http://www.adb.org/site/safeguards/safeguard-categories

| | |
|---|---|
| **පරිසරය** | A |
| **ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම** | A |
| **ආදිවාසී ජනතාව** | C |

## පාරිසරික සහ සාමාජයීය අංග පිළිබඳ සාරාංශය

**පාරිසරික අංගය**
A කාණ්ඩය

**ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම**
A කාණ්ඩය

**ආදිවාසී ජනතාව**
C කාණ්ඩය

## පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය, සහභාගිත්වය සහ උපදේශනය

**ව්‍යාපෘති සැලසුම්කරණ කාලය අතරතුර**

ග්‍රාමීය ප්‍රජාව, දේශීය පදිංචිකරුවන්, ග්‍රාමීය කාන්තා කණ්ඩායම්, රාජ්‍ය නිළධාරීන්ගේ නියෝජිතයන් සහ ක්‍රියාත්මක කිරීමේ සහ ක්‍රියාවට නැන්වීමේ නියෝජිතායතන වැනි විවිධ පාර්ශවකරුවන් සමඟ උපදේශන පැවැත්වීය. විවිධ සංක්‍රමණ සහ බෙදාහරින ලද උපව්‍යාපෘති ස්ථානයන් ආවරණය කරමින් ප්‍රජා නියෝජිතයන් 34 ක් සමඟ ඉලක්කගත කණ්ඩායම් සාකච්ජා පවත්වන ලදී. නව ව්‍යාපෘති සහ වැඩසටහන් පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කරන ලදී. සත්කාරක ප්‍රජාව ඇතුළත්ව ජලවිදුලි ව්‍යාපෘති සඳහා විධිමත් සහ අවිධිමත් උපදේශනයන් පවත්වන ලදී. ඉඩම් අත්පත්කර ගැනීම සහ නැවත පදිංචිකිරීම් ක්‍රියාත්මක කිරීම අතරතුර මූලික පාර්ශවකරු ලෙස කටයුතු කිරීමට ජලවිදුලි ව්‍යාපෘති ප්‍රදේශ තුළ ග්‍රාමීය කමිටුවක් පිහිටුවන ලදී.

**ව්‍යාපෘතිය ක්‍රියාවට නැන්වීම අතරතුර**

ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීම අතරතුර සිවිල් සමාජ ඇතුළුව සියළුම පාර්ශවකරුවන් සමග උපදේශණ තවදුරටත් පැවැත්වෙනු ඇත. බලපෑමට ලක්වූ ජනතා නියෝජිතයන් සමග නිවාස කමිටුව සහ නැවත පදිංචි කිරීමේ කමිටුව මොනරාගල ජලවිදුලි ව්‍යාපෘතිය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සමග ඉඩම් අත්පත්කර ගැනීම ක්‍රියාත්මක කිරීමට සහ නැවත පදිංචිකිරීම් ගැටළු සම්බන්ධයෙන් සමීපව කටයුතු කරනු ඇත. ජලාශ ආරක්ෂාව තක්සේරු කිරීම, සහ මොරගොල්ල වෙල්ල ආශ්‍රිත අන්තරායට ලක්වූ මත්ස්‍යයින් පවත්වාගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සහ මහවැලි අධිකාරිය අතර යටිගංබලා ගලායන ජලය සනාථ කරලීමට සුදුසු යාන්ත්‍රණයක් සැකසීමට අඛණ්ඩ උපදේශනයන් පැවැත්වෙමින් පවතින අතර ඉදිරියටත් පැවැත්වෙනු ඇත. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අතරතුර තොරතුරු බෙදාහැරීම තවදුරටත් සිදුවනු ඇත.

## විස්තරය

මෑත වසර කිහිපය තුළදී ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය දියුණුවී ඇති අතර 1990 දී 29% ක්ව පැවති ජාතික විදුලිබල ආවරණ අනුපාතයට සාපේක්ෂව එය 94% (2012) දක්වා ලගා වී ඇත. කෙසේ වෙතත්, දිගු කාලීන අභියෝගය වන්නේ මිල අධික පොසිල ඉන්ධන බලශක්තිය මත පවතින රැදියාව අඩු කිරීමයි. බලශක්ති ක්ෂේත්‍රය (a) වර්ධනය වෙමින් පවතින විදුලි ඉල්ලුම පිළිගත හැකි ධරණීය අනුපාතයකින් අවම මිලකට සපුරාලීම, සහ (b) දිගුකාලීන ධරණීය හැකියාව ලගාකර ගැනීමට වෙහෙසෙයි. බලශක්ති උත්පාදන මිශ්‍රණය තුළ තෙල් දහන තාපයෙන් ලබා ගන්නා බලශක්ති අනුපාතය 1995 දී 6% සිට ඉහළ පිරිවැයකින් යුත් බලශක්ති උත්පාදන පදනමක් නිර්මාණය කරමින් 2012 වන විට 59% දක්වා ඉහළ ගොස් ඇත. ඉල්ලුමේ වර්ධනය මූලික වශයෙන් මිල අධික තෙල් දහන තාප බලාගාරයන් හරහා සපුරා ඇත. දිගුකාලීනමය වශයෙන් මෙය රටේ බලශක්ති සුරක්ෂිතතාවය සහ පාරිසරික ආරක්ෂාව සම්බන්ධයෙන් ජීව්‍ය සහ ධරණීය විසඳුමක් නොවේ. මෙම තත්වය නිවැරදි කිරීමට එකම මාර්ගය වන්නේ බලශක්ති උත්පාදන මිශ්‍රණය මූලික වශයෙන් ප්‍රතිසංස්කරණය කල හැකි බලශක්ති මූලාශ්‍ර කෙරෙහි විවිධාංගීකරණය කිරීම, වැඩිදියුණු කල ජාල කාර්යක්ෂමතාවය, අවම කරන ලද තාක්ෂණික පාඩු සහ සැපයුම් සහ ඉල්ලුම් අංශ කළමනාකරණයයි. විශේෂයෙන්ම අතීතයේ ගැටුම් වලින් බලපෑමට ලක්වූ උතුරු සහ නැගෙනහිර පලාත්වල ප්‍රදේශයන්ට සම්ප්‍රේෂණ ජාලය පුළුල් කිරීම සහ නවීකරණය කිරීම අවශ්‍යය. අඩු විශ්වසනීයත්වයකින් සහ පහත් ගුණත්වයකින් යුත් විදුලි සැපයුමක් ලබන බොහෝ කුටුම්භ සිටින ග්‍රාමීය ප්‍රදේශ වලට කිලෝවෝල්ට් (kV) 33 ක මධ්‍යම වෝල්ටීයතා (MV) ජාලය සිය බල සැපයුම පුළුල් කිරීම අත්‍යාවශ්‍ය වේ. බලශක්ති ක්ෂේත්‍රයේ ධරණීය ක්‍රියාකාරිත්වය සඳහා 2009 ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව රජය විසින් මූල්‍ය, කළමනාකරණ, සහ ආයතනික ප්‍රතිසංස්කරණ නොනැවතී කරගෙන යයි.

## ව්‍යාපෘති සාධාරණීකරණය සහ දේශීය/ කාලාපීය ක්‍රමෝපාය කෙරෙහි ඇති සම්බන්ධය

2006 වසරේදී සකස් කර 2010 වසරේදී යාවත්කාලීන කල 'දස වසර සංවර්ධන රාමුව' මත පාදකවූ ජාතික ආයෝජන වැඩසටහනක් ශ්‍රී ලංකාව සතුව පවතී. ජාතික බලශක්ති ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය සමග සම්බන්ධවූ දිගු කාලීන බලශක්ති ක්ෂේත්‍ර ආයෝජන වැඩසටහනක්, ක්ෂේත්‍ර මාර්ග සැලැස්මක්, සහ සුදුසු ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්තරණ පිළියම් එකී රාමුව තුළ අඩංගු වේ. ඒ යටතේ පවතින පරමාර්ථ වන්නේ (i) 2020 වන විට බලශක්ති සැපයුම් ධාරිතාවය මෙගාවොට් 6,400 දක්වා ඉහළ නැන්වීම සහ ගල් අගුරු බලාගාර තුනක් මගින් මෙගාවොට් 2,000 පමණ සමස්ත පදනම් ධාරිතාවක් එකතු කිරීම හරහා බලශක්ති උත්පාදන පිරිවැය අඩු කිරීම; (ii) 2020 වන විට සාම්ප්‍රදායික ප්‍රතිසංස්කරණය කල හැකි බලශක්ති මූලාශ්‍ර මගින් ලබා දෙන ජාලගත බලශක්ති සැපයුමේ කොටස 20% දක්වා ඉහළ නැන්වීම; සහ (iii) 2020 වන විට ජාලයේ සමස්ත හානි 10.0% ට අඩු කිරීමයි. ගල්අගුරු හරහා මෙගාවොට් 2000 ක ධාරිතාවයක් බිහිකිරීමේ රජයේ අපේක්ෂාව වන්නේ පිරිවැය ආවරණ අපේක්ෂාව තවදුරටත් පවත්වාගෙනන යාමයි. අඩු වියදම් ගල් අගරු බලශක්ති උත්පාදනය හදුන්වාදීම සමග වර්තමානයේ ඉහළ පිරිවැයකින් යුත් තාප බල උත්පාදනය අඩු කිරීම හරහා 2017 වන විට පිරිවැය ආවරණය අරමුණට ලගා විය හැකිය. බලශක්ති සුරක්ෂිතතාවය ලගාකරගැනීම සඳහා ප්‍රතිසංස්කරණය කල හැකි බලශක්ති ගොඩනැගීම අන්නෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ගෙන දෙයි. එහි පිරිවැය ආවරණ ක්‍රමෝපායේ කොටසක් ලෙස 2013 අප්‍රේල් මස රජය විසින් සුළු පරිභෝජන විදුලි ගාස්තු 35% කින් ඉහළ දමන ලදී. සැපයුම් ධාරිතාවය ඉහළ නැන්වීමට රජය අපේක්ෂාකරන අතරතුර මිල අධික සහ අකාර්යක්ෂම ඛණිජතෙල් බලාගාර වෙනුවට ගල්අඟුරු බලාගාර ඉදිකිරීමද, ප්‍රතිසංස්කරණය කල හැකි මූලාශ්‍ර (නුදුරු අනාගතයේදී ඛණිජ තෙල් බලාගාර ගෑස් බලාගාර වලට පරිවර්ථනය වනු ඇත) හරහා ඉතිරි සැපයුම් ධාරතාවය ලබා ගැනීමද සිදුකරනු ඇත. සාම්ප්‍රදායික ජලවිදුලි උත්පාදනය වන 28% (2012) අමතරව සාම්ප්‍රදායික නොවන ප්‍රතිසංස්කරණය කල හැකි මූලාශ්‍ර හරහා බලශක්ති උත්පාදනය 20% කින් ඉහළ යයි. එසේම අනාගතයේදී දේශීය පිරිසිදු බලශක්ති මූලාශ්‍ර හරහා සැලකියයුතු බලශක්තියක් උත්පාදනය කිරීමද සනාථ කරයි. මෙමගින් බලශක්ති සුරක්ෂිතතාවය පිළිබඳ ප්‍රබල ගැටළුව පිළිබඳවද අවධානය යොමු කරනු ඇත.

## සංවර්ධනයේ බලපෑම

දියුණු පිවිතුරු බලශක්ති උත්පාදනය, පද්ධති කාර්යක්ෂමතාවය සහ විශ්වසනීයත්වය

## ව්‍යාපෘති ප්‍රතිඵල

| ප්‍රතිඵල පිළිබඳ විස්තරය | ප්‍රතිඵල දෙසටවූ ප්‍රගතිය |
|---|---|
| ඉහළ නන්වන ලද ජල විදුලි උත්පාදන ධාරිතාවය සහ සම්ප්‍රේෂණය මෙන්ම මධ්‍යම වෝල්ටීයතා ජාල කාර්යක්ෂමතාවය. | **ක්‍රියාත්මක වෙමින් පවතී** |

## ප්‍රතිඵල සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

| ව්‍යාපෘති ප්‍රතිඵල පිළිබඳ විස්තරය | ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තත්වයන් (ප්‍රතිඵල, ක්‍රියාකාරකම් සහ කරුණු) |
|---|---|
| ජලවිදුලි උත්පාදනය මධ්‍යම පලාත තුළ ගොඩනගා ඇත. සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කර ඇත. මධ්‍යම වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂමතාවය ඉහළ නන්වා ඇත. බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා ඉල්ලුම් අංශයේ බලපෑම කළමනාකරණය වැඩිදියුණු කර ඇත. ලංකා විදුලිබල මණ්ඩලයට ධාරිතා සංවර්ධන සහාය ලබාදී ඇත. | ප්‍රධාන ජාත්‍යන්තර තරඟකාරී ලංසු තැබීම් (ICB) 8 කින් 4 ක ප්‍රසම්පාදනය අවසන් කර ඇති අතර යොමුකරන ලද යෝජනා ඇගයීම මේවන විට සිදුවෙමින් පවතී. උපදේශකයින් (මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණය සහ සුපරීක්ෂණය; දෙවැනි ණය වාරිකය සැකසීම; සහ ශක්‍යතා ගොඩනැගීම සඳහා) බඳවා ගැනීම සිදු කරමින් පවතී. |
| **සංවර්ධන අරමුණු පිළිබඳ තත්වයන්** | **මෙහෙයුම්/ ඉදිකිරීම් පිළිබඳ තත්වයන්** |
| – | – |
| **වැදගත් වෙනස්කම්** | |
| – | |

## ව්‍යාපාරික අවස්ථාවන්

**පළමු ලැයිස්තුගත කළ දිනය** 2014 ජූලි 18

**උපදේශණ සේවාවන්**

බල ශක්ති ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා ශක්‍යතා ගොඩනැගීමට මෙන්ම ජලවිදුලි බලය උත්පාදනය සහ වෙනත් උප-ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික, සුපරීක්ෂණ සහ උපදේශකත්වය සැපයීමට උපදේශකයින් ලංකා විදුලිබල මණ්ඩලය විසින් බඳවා ගනු ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ මාර්ගෝපදේශය තුළ උපදේශකයින් භාවිතය සම්බන්ධ උපදෙස් භාවිත කරමින් උපදේශකයින් බඳවා ගනු ඇත.

**ප්‍රසම්පාදනය**

ආසියානු සංවර්ධන බැංකුවේ මාර්ගෝපදේශයට අනුව වැඩකටයුතු, භාණ්ඩ, සහ සේවා සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරනු ඇත. ආසියානු සංවර්ධන බැංකුව විසින් කල්තියා ගිවිසුම්ගත කිරීම් සඳහා ඉඩ සලසයි. ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය භාණ්ඩ සහ turnkey කොන්ත්‍රාත් කෙරෙහි දේශීය වරණ සඳහා ඉඩ සලසයි. රජය විසින් දේශීය වරණ පහසුකම භාණ්ඩ සහ turnkey කොන්ත්‍රාත් සඳහා ඉල්ලුම්කර ඇති අතර මේ සම්බන්ද වැඩිදුර තොරතුරු ලංසු ලියකියවිලි වලට ඇතුලත් කර ඇත. 132 kV සහ 220 kV බෙදාහැරීමේ ජාල, ජල විදුලිබල උත්පාදක පැකේජ, 220/132/33 kV ග්‍රිඩ් උපපොලවල්, 33 kV බෙදාහැරීමේ මධ්‍යස්ථාන හා ග්‍රාන්ට්ස් හා DSM උපව්‍යාප්ති සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු ක්‍රමය අනුගමනය කරනු ඇත.

| |
|---|
| **ප්‍රසම්පාදන සහ උපදේශණ නිවේදන**<br>http://www.adb.org/projects/47037-004/business-opportunities |

## කාලසටහන

| | |
|---|---|
| **සංකල්ප අනුමත කිරීම** | – |
| **තොරතුරු සෙවීම** | – |
| **කළමණාකරණ සමලෝචන රැස්වීම** | 2014 අප්‍රේල් 7 |
| **අනුමැතිය** | 2014 ජූලි 29 |

## ඉතා වැදගත් අවස්ථාවන් / සන්ධිස්ථාන

| **අනුමැති අංකය** | **අනුමැතිය** | **අත්සන් කිරීම** | **කාර්යසාධනය** | **නිම කිරීම** | | |
|---|---|---|---|---|---|---|
| | | | | **ප්‍රථම** | **සංශෝධනය** | **සැබෑ** |
| ණය 3146 | 2014 ජූලි 29 | 2014 නොවැම්බර් 20 | 2015 පෙබරවාරි 2 | 2020 මාර්තු 31 | – | – |

## උපයෝගීකරණය

| **දිනය** | **අනුමැති අංකය** | **ආ.ස.බැ (ඇ.එ.ජ ඩොලර් දහස්)** | **වෙනත් (ඇ.එ.ජ ඩොලර් දහස්)** | **ශුද්ධ අනුපාතය** |
|---|---|---|---|---|
| **සමුච්චිත ගිවිසුම් පිරිනැමීම්** | | | | |
| – | – | – | – | – |
| **සමුච්චිත වියපැහැදිම් ගෙවීම** | | | | |
| – | – | – | – | – |

## සම්බන්ධවීමේ සහ යාවත්කාලීන කිරීමේ විස්තර

| | |
|---|---|
| **ආ.ස.බැ වගකිව යුතු නිළධාරී** | මුක්ටර් කමුද්කහනොව් (mkhamudkhanov@adb.org) |
| **ආ.ස.බැ වගකිව යුතු දෙපාර්තමේන්තුව** | දකුණු ආසියා දෙපාර්තමේන්තුව |
| **ආ.ස.බැ වගකිව යුතු අංශය** | බලශක්ති අංශය, දකුණු ආසියා දෙපාර්තමේන්තුව |
| **ක්‍රියාවට නැන්වීමේ නියෝජිත ආයතන** | – |

## යොමු

| | |
|---|---|
| **ව්‍යාපෘති වෙබ් පිටුව** | http://www.adb.org/projects/47037-004/main |
| **ව්‍යාපෘති ලිපි ලේඛණ ලැයිස්තුව** | http://www.adb.org/projects/47037-004/documents |